සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP** 23 | S | I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ..................

# දේශපාලන විද්‍යාව - I

කාලය පැය 02 යි

<u>උපදෙස්:</u>

- මෙම ප්‍රශ්න පත්‍රය A හා B යනුවෙන් කොටස් 02 කි.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් සමන්විතය.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

## A කොටස

- අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

(01) දේශපාලනය ශාස්ත්‍රීයව හැදෑරීම,
(1) පාසල තුළ පමණක් සිදු කරයි.
(2) විෂය නිර්දේශයක් නොමැතිව සිදු කළ හැක.
(3) සිද්ධාන්ත පිළිබඳව වැඩි අවධානයක් යොමු නොකරයි.
(4) තමා තුළ ඇති උපකල්පන, රුචි අරුචිකම් ප්‍රයෝජනයට ගනිමින් සිදු කරයි.
(5) ගුරුවරු, දේශකවරු යටතේ සිදු කරයි. (..........)

(02) සමාජ විද්‍යාත්මක ප්‍රවේශය,
(1) දේශපාලනය සමාජයේ අනෙකුත් පැතිකඩවලින් හුදකලාව, වියුක්තව පවතින දෙයක් බව පිළිගනී.
(2) සාම්ප්‍රදායික අධ්‍යයන ප්‍රවේශයකි.
(3) දේශපාලනයට බලපාන සමාජ සාධක පිළිබඳ අධ්‍යනය කරයි.
(4) මුළු සමාජයම සමස්තයක් ලෙස සලකා අධ්‍යනය කරයි.
(5) ආර්ථික සාධකය මත ඇතිවන චලනය තුළින් සමාජීය වෙනස්කම් නිර්මාණය වන බව පෙන්වා දෙයි. (..........)

(03) නිරාගමිකවාදය,
(1) ආගමික මූලධර්මවාදයට ඇති ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයකි.
(2) ඉන්දියානු ව්‍යවස්ථාව තුළ මෙය ප්‍රජාතන්ත්‍රවාදයේ තරමටම වැදගත් කොට නොසලකයි.
(3) පදනම් වූ රාජ්‍යවල ආගම පදනම් කරගත් දේශපාලන පක්ෂ හා ව්‍යාපාර දක්නට නො ලැබේ.
(4) සමාජවාදී නිරාගමිකවාදයට අනුව ආගමික ආයතන හා ආගමික දේපළවලට නිදහස ඇත.
(5) ආගම සමාජයේ නොතිබිය යුතු යැයි ලිබරල් නිරාගමිකවාදය ප්‍රකාශ කරයි. (..........)

(04) ගැටුම් කළමනාකරණය,
(1) ගැටුමක යෙදී සිටින පාර්ශව ගැටුම විසඳාගැනීම සඳහා යොදාගන්නා සාකච්ඡාමය ක්‍රියාවලියයි.
(2) ගැටුමේ තීව්‍රතාව හා ව්‍යාප්තියේ පරිමාව සීමා කිරීමයි.
(3) ගැටුම් ඇතිවීමේ සාධක, ඉඩකඩ හා ස්ථාන හඳුනාගත් පසු ඒවා ගැටුම් බවට උත්සන්න වීම - වැළැක්වීමයි.
(4) ගැටුමේ පාර්ශවකරුවන්, ගැටුමට තුඩු දී ඇති නිමිති සහ ගැටුමෙන් අපේක්ෂිත අරමුණු වෙනස් වීමයි.
(5) ගැටුම සඳහා තුන්වන පාර්ශවයක මැදිහත් වීමයි. (..........)

(05) නව ලිබරල්වාදී රාජ්‍යයේ කාර්යභාරයක් නොවන්නේ,

(1) නිදහස් වෙළඳපොළ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය සාමකාමී පරිසරය ස්ථාපිත කිරීම.

(2) යුක්තිය පසිඳලීම.

(3) සමාජ සහ දේශපාලන කටයුතු සීමිත ප්‍රමාණයකින් කළමනාකරණය කිරීම.

(4) ජගත් ආර්ථිකය හැසිරවීම.

(5) ජාතික ආර්ථිකය විවෘත කිරීම. (.........)

(06) රාජ්‍ය සහ පුරවැසියා,

(1) ග්‍රීක නාගරික රාජ්‍යන්හි පුරවැසියාට හිමිවූයේ අඩු වැදගත්කමකි.

(2) සෑම රාජ්‍යයක් ම පුරවැසියන් සම්බන්ධයෙන් දරන්නේ එකම අදහසකි.

(3) සියලු ම පුරවැසියන් රාජ්‍යයට සිය අවනතභාවය දැක්විය යුතුය.

(4) නූතන රාජ්‍යයන් හි දේශපාලන කටයුතු සඳහා සක්‍රියව සම්බන්ධ වන තැනැත්තන් පුරවැසියන් ලෙස සලකයි.

(5) රාජ්‍යයෙන් තොරව පුරවැසියාට පැවැත්මක් ඇත. (.........)

(07) බලතල බෙදීමේ න්‍යාය,

(1) ආණ්ඩුක්‍රම අනුගමනය කළ යුතු විධිවිධානයක් නොවේ.

(2) මෙය මුල් වරට යොදාගනු ලැබුයේ ඇමරිකානු ව්‍යවස්ථාව තුළයි.

(3) අනුව රාජ්‍ය බලය සංවිධානය කර ඇති ස්වරූපය සහ නිදහස අතර සහසම්බන්ධයක් නැත.

(4) එකිනෙක ආයතනවල බලය පාලනය නොවිය යුතු බව අවධාරණය කරයි.

(5) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ දී මෙහි ප්‍රායෝගික වැදගත්කම බෙහෙවින් ම අඩු වී ඇත. (.........)

(08) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය,

(1) ආර්ථික හා සමාජ විෂමතාවලට විසඳුම් සපයයි.

(2) සම්බන්ධ භාවිතයන් රටින් රටට වෙනස් නොවේ.

(3) පුළුතරය ආරක්ෂා කිරීමට වැඩි අවධානයක් යොමු නොකරයි.

(4) ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රායෝගික සහ අර්ථාන්විත එකම ස්වරූපයයි.

(5) ධනවාදයේ දේශපාලන ප්‍රකාශනයයි. (.........)

(09) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

(1) 1960 ගණන්වල මෙරට වාමාංශික ව්‍යාපාරය කොටස් දෙකකට බෙදුනි.

(2) මෑත කාලීනව සභාග ආණ්ඩු බිහිවීමේ ප්‍රවණතාවයක් ඇතිවිය.

(3) සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ තවමත් තම ජනප්‍රියතාවය පවත්වාගෙන යයි.

(4) කුඩා පක්ෂ ගණනාවක් බිහිවීම කෙරෙහි සමානුපාතික නියෝජන ක්‍රමය එතරම් බලපෑමක් සිදු කර නැත.

(5) නවීකරණය වූ දේශපාලන ක්‍රමයක් පැවතීම මෙරට දේශපාලන පක්ෂ රාශියක් බිහිවීම කෙරෙහි හේතු වී ඇත. (.........)

(10) සන්ධීය ආණ්ඩුක්‍රමය,

(1) මෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විකාශනාත්මක වේ.

(2) භූමියෙන් විශාල රාජ්‍යයන් සඳහා පමණක් සුදුසු වේ.

(3) භින්න වූ සමාජයන් එක්සත් කළ නොහැක.

(4) පුද්ගල නිදහස ආරක්ෂා කිරීමට ආධාර කරන සංවරණ හා තුලන ජාලයක් නිර්මාණය වේ.

(5) සන්ධීය ක්‍රමයේ ආරක්ෂකයා මධ්‍යම ආණ්ඩුවයි. (.........)

(11) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය,

(1) පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් සියල්ලෙහි ම දක්නට ලැබේ.
(2) රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගනී.
(3) කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට පිටතින් වුව ද තෝරා පත්කර ගත හැකිය.
(4) දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය වර්ධනය කරයි.
(5) විධායක බලය එක් පුද්ගලයෙකු වටා කේන්ද්‍රගත වී පවතී. (.........)

(12) සමකාලීන ලෝක දේශපාලනය,

(1) යුරෝපා කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වේ.
(2) පශ්චාත් කොමියුනිස්ට් රාජ්‍යයන් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් බවට පත්විය.
(3) කඳවුරු දෙකකට බෙදී ඇත.
(4) සමාජවාදය සම්පූර්ණයෙන් තුරන් වී ඇත.
(5) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ගෝලීය මතවාදය බවට පත්නොවුනි. (.........)

(13) අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධානයක් වන්නේ,

(1) ආසියාන් සංවිධානය
(2) ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය
(3) සාර්ක් සංවිධානය
(4) ලෝක බැංකුව
(5) යුරෝපා සංවිධානය (.........)

(14) ඉන්දියානු ෆෙඩරල් ක්‍රමය,

(1) සමමිතික බල බෙදීමක් කර ඇත.
(2) සන්ධියත්වය ව්‍යවස්ථාවෙන් ඍජුව ම ප්‍රකාශ කර ඇත.
(3) ඉන්දිය ශ්‍රේෂ්ඨාධිකරණය මෑතකාලීනව ප්‍රාන්ත ස්වාධීනභාව රැකදීම සඳහා කටයුතු කර ඇත.
(4) මධ්‍යම ආණ්ඩුවට නව ප්‍රාන්ත ඇතිකිරීමේ හැකියාවක් නොමැත.
(5) ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය දැඩි අනම්‍ය ස්වභාවයක් ගනී. (.........)

(15) බලපෑම් කණ්ඩායම්,

(1) රටක ප්‍රජාතන්ත්‍රවාදී සෞඛ්‍යයට තර්ජනයකි.
(2) ආණ්ඩු තුළට ගොස් නීති සම්පාදන ක්‍රියාවලියට බලපෑම් කරයි.
(3) දේශපාලන පක්ෂවලට අමතරව සහ සමාන්තරව ක්‍රියාත්මක වේ.
(4) තනි තේමාවක් මත පමණක් ගොඩනැගී ඇත.
(5) ව්‍යවස්ථා හා කාර්ය මණ්ඩලවලින් තොර සංවිධාන විශේෂයකි. (.........)

16) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) කිසියම් සංසිද්ධියක් පිළිබඳව තත්වානුරූපීව මනසින් ගොඩනගා ගනු ලබන අදහස්වල පිළිබිඹුව දර්ශනය යි.
(2) ඕනෑ ම දේශපාලන මතවාදයක් එකිනෙකට සංගත අදහස් මාලාවකින් සමන්විත වේ.
(3) යුක්තිය පිළිබඳ ජෝන් රෝල්ස්ගේ න්‍යාය විද්‍යාත්මක න්‍යාය සඳහා උදාහරණයකි.
(4) දේශපාලන න්‍යාය මගින් පවතින දේශපාලනයේ සැබෑ ස්වරූපය හේතු ඵලවාදය අනුව විග්‍රහ කරමින් එහි ඵලවිපාක දක්වයි.
(5) ඕනෑ ම සමාජයක දේශපාලනය යන්න ආයතනගත වී පවතී. (.........)

7) පළාත් සභාව සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

(1) මෙහි ක්‍රියාකාරීත්වය පාලනය කිරීම පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් කළ හැකිය.
(2) මහ ඇමති පළාත් විධායකයේ ප්‍රධානියා වේ.
(3) ව්‍යවස්ථා සංශෝධනයකින් තොරව අහෝසි කළ හැකිය.
(4) පළාත් සභාව ඉඩම් හා පොලිස් බලතල ක්‍රියාවට නංවයි.
(5) පළාත් සභාව සම්මත කරන නීතියක් වෙනස් කිරීමට මධ්‍යම ආණ්ඩුවට කිසිසේත්ම නොහැකිය. (.........)

(18) කෝල්බෲක් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ඇති වූ සමාජීය පරිවර්තනයක් වන්නේ,

(1) නව දේශීය ව්‍යවසාය පංතියක් බිහිවීම.

(2) වෘත්තීමය සිවිල් සේවාවක් වර්ධනය වීම.

(3) නිදහස් ස්වාධීන අධිකරණ ක්‍රමයක් වර්ධනය වීම සඳහා පදනම වැටීම.

(4) ප්‍රාදේශීය රදළ නායකයින්ගේ සමාජ බලය බිඳ වැටීම.

(5) නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය වීම. (.........)

(19) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය,

(1) මුල් ම වරට මුදල් කාරක සභාව හඳුන්වා දුන්නේ ය.

(2) අවුරුදු 18 ට වැඩි සියලු දෙනාට ඡන්ද බලය ප්‍රදානය කළේ ය.

(3) දේශීය නියෝජිතයන්ට ව්‍යවස්ථාදායක කාර්යන්ට පමණක් හවුල් වීමට අවස්ථාව දුන්නේය.

(4) වාමාංශික දේශපාලන පක්ෂවල වර්ධනය සඳහා හේතු විය.

(5) සුබසාධන රාජ්‍යයට අවශ්‍ය පදනම දැමීය. (.........)

(20) "BRICS" යනුවෙන් හඳුන්වන රටක් නොවන්නේ,

(1) රුසියාව (2) බ්‍රිතාන්‍ය (3) චීනය (4) බ්‍රසීලය (5) ඉන්දියාව (.........)

- අංක 21 - 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

(21) සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ,

A - ද්වි මාණ්ඩල වාදය පිළිගෙන තිබුණි.

B - පාර්ලිමේන්තු පරමාධිපත්‍යය ක්‍රියාත්මක විය.

C - ව්‍යවස්ථා විවරණ බලය සීමිත සහ අප්‍රකාශිත ලෙස අධිකරණයට හිමි වේ.

D - ආණ්ඩුව පාර්ලිමේන්තුව මගින් පාලනය විය.

E - කැබිනට් සාමූහික වගකීම ආරක්ෂා නොවුනි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.........)

(22) 1972 ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය,

A - ඡන්දයෙන් හා නාමකරණයෙන් පත් වූ මන්ත්‍රීන්ගෙන් සමන්විත විය.

B - 'ජාතික රාජ්‍ය සභාව' යනුවෙන් හඳුන්වයි.

C - නිල කාලය වසර 6 කි.

D - සම්මත කරන නීති විවරණය කිරීමේ බලය ව්‍යවස්ථාධිකරණයට හිමි නොවේ.

E - මගින් විධායකය පත්කරන ලදී.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.........)

(23) රාජ්‍ය ප්‍රතිපත්ති,

A - ක්‍රියාවට නැංවීම තාක්ෂණික ශිල්පීය ක්‍රියාවලියකි.

B - ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමේ හැකියාව අධිකරණය සතුව පවතී.

C - ක්‍රියාදාමයේ සෑම අදියරකදී ම දේශපාලන පක්ෂ වැදගත් වේ.

D - මගින් සාකච්ඡා කරන්නේ සැබෑ ගැටලු පමණි.

E - ක්‍රියාදාමයේ සෑම අදියරකදී ම සිවිල් සමාජය සහභාගී වේ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.........)

(24) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය,

A - නිදහසින් පසු විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කර ඇත.

B - වඩාත් සංවිධිත ආකාරයෙන් පවත්වාගෙන යාම ආරම්භ කරන්නේ නිදහසට පෙර යුගයේ පටන්මය.

C - මෙහි ස්වභාවය තීරණය වීම කෙරෙහි පාලන තන්ත්‍රයේ අරමුණු හා අභිලාශ බොහෝ දුරට බලපෑම් කර ඇත.

D - තීරණය වීම කෙරෙහි ලංකාවේ භූ- දේශපාලනික පිහිටීම ද බලපෑම් කළේ ය.

E - ලංකාවේ බහු සංස්කෘතිමය ස්වභාවය ද විදේශ ප්‍රතිපත්තිය තීරණය වීම කෙරෙහි බලපෑම් කරයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.........)

(25) එක්සත් ජාතීන් හා ශ්‍රී ලංකාව.

A - ලංකාව 1955 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ඇත.

B - ආර්ථික, සමාජීය හා සංස්කෘත සහයෝගිතා වැඩසටහන්වල සාමාජිකයෙකු වශයෙන් ලංකාව නිරතුරුවම රැඳී සිටී.

C - 1955 වර්ෂයේ සිටම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වී ඇත.

D - මානව අයිතිවාසිකම්, කම්කරු හා පාරිසරික අයිතිවාසිකම් සඳහා වන ප්‍රඥප්තීන් ගණනාවක් ශ්‍රී ලංකාව අනුමත කර ඇත.

E - 1960 - 1965 අතර කාලය තුළ ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය නොවන සාමාජිකත්වය දරා ඇත.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.........)

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍ය | සත්‍ය |
| 2 | සත්‍ය | අසත්‍ය |
| 3 | අසත්‍ය | සත්‍ය |
| 4 | අසත්‍ය | අසත්‍ය |
| 5 | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (26) | 1978 ආණ්ඩුක්‍රමය අනුව කැබිනට් මණ්ඩලයේ නායකයා වන ජනාධිපති පාර්ලිමේන්තුවට වගකීමට මිස උත්තර දීමට බැඳී නැත. | අගමැතිවරයා කුමන හෝ අයුරකින් ධුරය දැරීම නතර වූ විට කැබිනට් මණ්ඩලය ද විසිර යන්නේ ය. (......) |
| (27) | 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉතා ම බලගතු ජනාධිපති ධුරයක් නිර්මාණය කළේ ය. | මේ අනුව ජනාධිපතිවරයාට නැවත නැවත පත්වීමේ හැකියාව ලැබුණි. (......) |
| (28) | 20 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තුව බලවත් ආයතනයක් බවට පත් කොට ඇත. | දෙමුහුන් ආණ්ඩු ක්‍රමයක් වන නිසා සහහැසිරීමක් ඇති විය හැකි හෙයින් රටේ පාලනය අකර්මන්‍ය වීමේ වැඩි සම්භාවිතාවයක් පවතී. (......) |
| (29) | ව්‍යවස්ථාවේ 55 වන වගන්තියට අනුව රජයේ නිලධරයන් සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කාරණ සඳහා විධිවිධාන සැලසීම අමාත්‍ය මණ්ඩලය විසින් කළ යුතුය. | රාජ්‍ය සේවා කොමිසමේ තීරණ වෙනස් කිරීමට, අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලයට බලය නැත. (......) |
| (30) | නීතියෙන් පිහිටුවන ලද ඉහළම මුල් අවස්ථා අධිකරණය වන්නේ මහාධිකරණයයි. | විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් යම් අයෙකුගේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වූයේ නම් ඒ පිළිබඳ ලිඛිත පෙත්සමක් මාසයක කාලයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළයුත්තේ ය. (......) |

## B කොටස

31. දේශපාලන විද්‍යාව යනු කුමක් දැයි හඳුනාගැනීමේ දී මූලික කාරණා කිහිපයක් වැදගත් ය. ඉන් දෙකක් ලියන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

32. පාර්ලිමේන්තු ආයතනයක පැවැත්ම සඳහා ඒවාට හැඩ ගැසුණු භාවිත ගණනාවක්ම පවතී. ඉන් දෙකක් දක්වන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

33. දේශපාලනය සම්බන්ධයෙන් වැදගත් වන පහත කෘතීන් හි කතුවරුන් පිළිවෙලින් දක්වන්න.

(1) ජාතික රාජ්‍යයේ අවසානය - ..............................................................

(2) පරිකල්පිත ප්‍රජාව - ..............................................................

34. දේශපාලන විද්‍යාව සිවිල් සමාජය පිළිබඳ උනන්දු වීමට හේතු ගණනාවකි. ඉන් දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

35. වර්තමානයේ දී ස්වාධිපත්‍ය පිළිබඳ සංකල්පය අභියෝගයට ලක්වන අවස්ථා දෙකක් ලියන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

36. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ පවතින අති මූලික ගති ලක්ෂණ දෙක සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

37. රූසෝ සමාජ සම්මුතිවාදය ඉදිරිපත් කිරීමේ දී මාධ්‍ය කොටගත් සංකල්ප දෙක දක්වන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

38. තුන්වැනි ලෝකයේ සමාජවාදය පිළිබඳ ප්‍රධාන ප්‍රකාශකයන් දෙදෙනෙක් නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

39. සීමිත ආණ්ඩුව පිළිබඳ සංකල්පය වර්ධනය වීමේ දී එයට පසු කාලයේ දී එක් වූ අංග දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

40. ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වේ. එම මණ්ඩල දෙක නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

41. විජිත කාරක රාජ්‍ය යටතේ විජිත ගොඩනගන්නේ හා ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන්නේ සාධක කිහිපයක බලපෑමෙනි. ඉන් දෙකක් ලියන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

42. වර්තමානයේ දී රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය සතු බලය සීඝ්‍රයෙන් කප්පාදු වෙමින් පවතී. ඒ සඳහා බලපා ඇති හේතු දෙකක් ලියන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

43. සෝල්බරි ආණ්ඩුක්‍රමය බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙන් වෙනස් වන කරුණු දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

44. ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමයේ නවාංග දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

45. මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ගෙන ඇති විධි විධාන දෙක සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

46. 1648 වෙස්ට්ෆේලියා සාම සම්මුතිය මගින් නූතන රාජ්‍ය පිළිබඳ ප්‍රධාන අදහස් දෙකක් බිහිවිය. ඒ මොනවාද?

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

47. රාජ්‍යයන් ස්වකීය ජාතික අභිලාශ මුදුන්පත් කරගන්නා මධ්‍යයන් දෙකක් ලියන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

48. නූතන විදේශ ප්‍රතිපත්තියේ සුජාත මාධ්‍යයන් දෙකක් දක්වන්න..

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

49. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අහෝසි කරන ලද කොමිෂන් සභා දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

50. පහත කෙටි නාමයන්ගෙන් හඳුන්වන සංවිධාන නම් කරන්න.

(1) IBRD - ..............................................................................................................

(2) ADB - ..............................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## Provincial Department of Education - NWP

23 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ..................

## දේශපාලන විද්‍යාව - II

කාලය පැය 03 යි

උපදෙස් -

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.
- පළමුවැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තුන්වැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

### I කොටස

01. "දේශපාලනය යන්න සමාජයේ පැවතීමේ පැතිකඩ කිහිපයකි." විමසන්න. (ලකුණු 20)

02. ජීකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම අතර සංසන්දනාත්මක විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 20)

03. (i) දේශපාලන මතවාදවල කාර්යභාරයන් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) දේශපාලන මතවාද ලෙස ලිබරල්වාදයේ සහ සමූහාණ්ඩුවාදයේ සමානතා හා වෙනස්කම් සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 15)

### II කොටස

04. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මූලික ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20)

05. "වෙස්ට්මිනිස්ටර් අංග ලක්ෂණ සෝල්බරි සහ ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමවල ක්‍රියාත්මක වූ ආකාරය සංසන්දනාත්මකව" විස්තර කරන්න. (ලකුණු 20)

06. 1978 ආණ්ඩුක්‍රමයෙ හි ජනාධිපතිවරයා වෙත සියලු විධායක බලය කේන්ද්‍රගත කර ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 20)

07. 1978 ආණ්ඩු ක්‍රමය යටතේ පහත මාතෘකා විස්තර කරන්න.

(i) ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ ක්‍රමය. (ලකුණු 10)

(ii) ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ක්‍රමය. (ලකුණු 10)

### III කොටස

08. ඇමරිකානු ආණ්ඩු ක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ හෝ ස්විට්සර්ලන්ත ආණ්ඩු ක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20)

09. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී මුහුණ දෙන අභියෝග සහ ගැටලු පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 20)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ගැටුම් වර්ගීකරණය හෝ ගැටුම් ජීවන චක්‍රය

(ii) සමාජවාදී රාජ්‍ය මාදිලිය

(iii) 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

(iv) සීමිත ආණ්ඩුව

(v) රාජ්‍ය ප්‍රතිපත්ති හා නිලබල ක්‍රමය

(vi) ජාතික බලය හා ජාතික අභිලාශ

(ලකුණු 10 × 2 = 20)


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න